**අනුමත වෙලා තිබෙන බව කියන මැතිවරණ ක්‍රමය ගැන යම් කිසි අධ්‍යනයක් කළාද?**
ඔය කියන එක අපිට තවම ඉදිරිපත් කරලත් නෑ. අපි දැකලත් නෑ. එය කැබිනට් මණ්ඩලය අනුමත කළාද කියලා අපි හරියටම දන්නෙත් නෑ. ඉතිං අපිට පුලුවන්ද ඒ ඡන්ද ක්‍රමය ගැන සාකච්ඡාවක් කරන්න ඒ විදිහට?
මහ මැතිවරණයෙන් පසුව මුළු පාර්ලිමේන්තුවම ආණ්ඩුවක් බවට පත්කරන ක්‍රමයක් ගැන අගමැතිවරයා අදහස් දක්වා තිබෙනවා. ජාතික ආණ්ඩුවක් ගැන අදහසක් ජනාධිපතිවරයාත් ඉදිරිපත් කර තිබෙනවා. මේ වෙන්නට යන වෙනස ජවිපෙ විග්‍රහ කරගන්නේ කෙසේද?
මේ මොහොතේ අපි කිසිසේත්ම අවධානය යොමුකරලා නැහැ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව ආණ්ඩු පිළිබඳව. අපි වැඩිම අවධානය යොමු කරනවා මැතිවරණයේදී ජනතාව වෙත ගොස් පාර්ලිමේන්තුවේ බලවත් බලයක් නිර්මාණය කරගැනීම වෙනුවෙන්. අනතුරුව අපි කල්පනා කරනවා මොකක්ද ගොඩනැඟන ආණ්ඩුව කියලා. මේ දේශපාලන පක්ෂ අවුරුදු 66ක් මුළුල්ලේ වෙන්වෙන්ව ආණ්ඩු කළා. වෙන්ව ආණ්ඩු කරලා රටට ජයග්‍රහණ අත්පත් කර දෙන්න බැරිවුණා. දැන් එක්වෙලා ආණ්ඩු කරන්න උත්සාහ කරන්නේ ඔවුන්ගේ තිබෙන දුබලතාවයේම තවත් එක් ප්‍රකාශනයක් ලෙසයි.
නමුත් අපි එකක් කියනවා. මේ දෙගොල්ල එකතුවෙලා ආණ්ඩු හදනවා නම් ඒක මැතිවරණයේදී කියන්න ඕනේ. එක්සත් ජාතික පක්ෂය ප්‍රකාශ කරන්න ඕනේ ''අපිට ඡන්දය දෙන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක එකතුවෙලා ආණ්ඩුවක් හදන්න'' කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්න ඕනේ ඔවුන්ට ඡන්දය දෙන්න එක්සත් ජාතික පක්ෂය එක්ක එකතුවෙලා ආණ්ඩුවක් හදන්න කියලා. එළැඹෙන ආණ්ඩුව හදන්නේ කොහොමද කියන ආකාරය ගැන ඔවුන් මැතිවරණ ව්‍යාපාරයේදී ප්‍රකාශ කළ යුතුයි. එසේ නැතිව ඡන්ද ව්‍යාපාරය ඇතුළේ එකිනෙකාට ප්‍රහාර එල්ල කරගෙන ඡන්ද කරලා ඡන්දෙන් පස්සේ එකතුවෙලා ආණ්ඩු කරන්න සූදානම් වෙන්න ඕනේ නෑ.

**"රට බාරගන්න - අපි සූදානම්" කියා සඳහන් දැන්වීමක් ජවිපෙන් නිකුත් කර තිබෙනවා. මොකක්ද මේ කියන රට බාරගැනීම? මොකක්ද ජවිපෙ තියන සූදානම?**
අපේ සංවිධාන යාන්ත්‍රණය, ප්‍රචාරක යාන්ත්‍රණය අපි සකස් කරලා තිබෙනවා. අපි ජනතාව වෙත පනිවිඩයක් ගෙනයමින් තිබෙනවා. රට ගොඩනැඟීම පිළිබඳ දැක්මක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ දැක්ම විස්තීර්ණය කොට වැඩ පිළිවෙළක් බවට පත්කරනවා. මොකද රටේ ජනතාව ඇති තරම් දේශපාලන පක්ෂ මාරු කරලා තිබෙනවා. නායකයන් මාරු කරලා තිබෙනවා. අපි ජනතාවට කියනවා පක්ෂ මාරු කිරීමෙන් නායකයන් මාරු කිරීමෙන් මේ රට වෙනස් කරන්න බැහැ කියලා. එහෙම පුලුවන්නම් පහුගිය අවුරුදු 66 තුළ රට වෙනස් විය යුතුයි. මේ රට වෙනස් කරන්න නම් සමාජ ආර්ථික දේහයේ පරිවර්ථනයක් ඕනේ. අන්න ඒ පරිවර්ථනය වෙනුවෙන් අපි රට බාරගන්න සූදානම්. ඒ වෙනුවෙන් අපේ වැඩපිළිවෙළ කුමක්ද කියන එක එළිදැක්වීම තමයි මේ ප්‍රචාරක වැඩපිළිවෙළේ අපේ අරමුණ බවට පත්වෙලා තිබෙන්නේ.

**20 වෙනි සංශෝධනය මුල් කරගනිමින් පාර්ලිමේන්තුව ඉදිරි අවුරුද්දත් පැවතිය හැකි තත්ත්වයකුයි දැන් පෙනෙන්නේ. එසේ වුවහොත් ජවිපෙ මොකද කරන්නේ?**
කිසිසේත්ම ඊට ඉඩ කඩ දිය යුතු නැහැ. පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණයක් කැඳවිය යුතුයි. අලුත් පාර්ලිමේන්තුවක් තෝරා පත්කර ගන්නට ජනතාවට අවස්ථාව ලබාදිය යුතුයි. පාර්ලිමේන්තු මැතිවරණයක් කැඳවීමේ බලය තිබෙන්නේ ජනාධිපතිවරයාට. ඔහුව බලයට පත්කළ ජනතාවගේ හඬට ඔහු සවන් දිය යුතුයි. එහෙම නැතිව ඔහු පරාජයට පත්කරන්ට කටයුතු කළ කණ්ඩායමේ හඬට නොවෙයි ඔහු සවන් දිය යුත්තේ.

**පසුගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පරාජයට පත්වුවත් වත්මන් පාර්ලිමේන්තුවට ලැබී ඇති ජනවරම එයින් අහෝසි වී නැති බව සන්ධානයේ නායකයන් පවසනවා. ඒ ගැන ඔබේ විග්‍රහය මොකක්ද?**
ජනාධිපතිවරයාට වෙනම ජන වරමක් තිබෙනවා. පාර්ලිමේන්තුවට වෙනම ජනවරමක් තිබෙනවා. ජනාධිපතිගේ ජනවරම වෙනස්වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ ජනවරම වෙනස් වෙලා නෑ කියන තර්කයනේ ඔය ගේන්නේ. නමුත් 2010 ජනවරම ලැබුණු පාර්ලිමේන්තුව නොවෙයි දැන් තිබෙන්නේ. 2010 ජනවරමේ රනිල් වික්‍රමසිංහට අගමැතිකම දුන්නද? එක්සත් ජාතික පක්ෂයට ආණ්ඩුවක් හදන්න දුන්නද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටියක් ආණ්ඩුවට යන්නත් කට්ටියක් විපක්ෂයේ වාඩිවෙන්නත් ජනවරමක් 2010 දුන්නද? ඒ නිසා මේ පාර්ලිමේන්තුව 2010 ජනවරම විකෘති කරන ලද පාර්ලිමේන්තුවක්. එනිසයි අපි කියන්නේ 2010 ජනවරම තවදුරටත් මේ පාර්ලිමේන්තුවේ පිළිඹිබු කරන්නේ නෑ කියලා. ඒ නිසයි අලුත් පාර්ලිමේන්තුවක් සඳහා ජනවරමක් පතන්න අපි ජනතාව ළඟට යන්න ඕනේ. මේ විකෘති වුණු, 2010 ජනවරම සමඟ කිසිම සම්බන්ධයක් නැති සෙල්ලං ගෙයක් වැනි පාර්ලිමේන්තුවට දීර්ඝ කාලයක් ඉදිරියට යන්න ඉඩ කඩ ලබාදිය යුතු නැහැ.

**මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා නැවතත් කිසියම් ආකාරයකට සක්‍රිය දේශපාලනයකට ප්‍රවේශවීම රටේ අනාගතයට කවර ආකාරයේ බලපෑමක් කරයි කියලද ඔබ හිතන්නේ?**
දේශපාලනික වශයෙන් නම් කිසිදු බලපෑමක් ඇති කරන්නේ නැහැ. නමුත් ඔහු දේශපාලනය කරන්න එනවා නම් ඔහු ජනතාවට පැහැදිලි කර දිය යුතු කරුණු ගණනාවක් තිබෙනවා. ඔහු රටේ ප්‍රජාතන්ත්‍රවාදය හදන්නේ කොහොමද? හැදුවේ කොහොමද? ඔහු හොරකම් නතර කරන්නේ කොහොමද? හොරකම් නතර කළේ කොහොමද? ඔහුගේ විදෙස් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වුණේ කොහොමද? ක්‍රියාත්මක කරන්නේ කොහොමද? ඔහු අධිකරණයේ ස්වාධීනත්වය හැදුවේ කොහොමද? හදන්නේ කොහොමද? ඒ දේශපාලන සටන් පාඨ සමඟ එනවා නම් අපිට ප්‍රශ්ණයක් මතුවෙන්නේ නෑ. නමුත් මොවුන් පැන නඟින්නේ ජාතිවාදී සටන් පාඨ මගින්. ඔහුගේ සහචරයන් මේ දවස්වල උපයෝගි කරගන්නා කොඩි පවා පෙන්නුම් කරන්නේ යම් ජාතිවාදී වුවමනාවක්. මැතිවරණයෙන් පසු ඔහු කළ ප්‍රකාශයන්වල තිබෙන්නේ ජාතිවාදී වුවමනාවන්. ඒ නිසා රාජපක්ෂත් රාජපක්ෂගේ සහචර කණ්ඩායමත් තමන්ගේ දේශපාලන බල ව්‍යාපෘතිය දියත් කරලා තිබෙන්නේ ජාතිවාදී ප්‍රවනතාවකින්. අන්න ඒ ජාතිවාදී ප්‍රවනතාවය රටට අහිතකරයි. ඒ නිසා රාජපක්ෂ පරාජය කළා වගේම රාජපක්ෂගේ ජාතිවාදී ප්‍රවණතාවයත් පරාජයට පත්කළ යුතුයි.

**නමුත් ඔහු ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරලා තිබෙනවා තමන්ගේ අතින් වැරදි සිදුවූ බවත් ආයෙත් නම් එවැනි වැරදි නොකරන බවත්?**
පළමු කොටම ඔහු කළ වැරදි මොනවාද කියා රටට කිව යුතුයි. හොරුන් ආරක්ෂා කරන්න ඇති. එහෙම නම් දැන් හොරුන් නීතිය හමුවට පමුනුවන්න අවස්ථාව දෙන්න. ඔහු අපරාධකරුවන් ආරක්ෂා කරන්න ඇති. එහෙම නම් දැන් ඒ අයව නීතිය හමුවට පමුණුවන්න අවස්ථාව ලබාදෙන්න. මේ බළලුන් සිල් ගන්නවා වගේ වැඩක්.

**ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජාතික පක්ෂයත් සමඟ යම් එකඟතාවකින් කටයුතු කරගෙන යන බවට ඇතැම් අය චෝදනා කරනවා. එහි සත්‍යතාවක් තිබෙනවාද?**
එය තරම් විහිළුවක් තවත් නෑ. රනිල් වික්‍රමසිංහ මහතා සමඟ හෝ එක්සත් ජාතික පක්ෂය සමඟ හෝ ඔවුන්ගේ වැඩ පිළිවෙළවල් සමඟ ඔවුන්ගේ වුවමනාවන් සමඟ, ඔවුන්ගේ අරමුණු, දේශපාලන සංස්කෘතිය සමඟ ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව කිසිදු එකඟතාවයකින් යන්න පුලුවන් දේශපාලන ව්‍යාපාරයක් නෙවෙයි. ඒ නිසා එම පක්ෂය හෝ නායකයන් සමඟ ඍජු හෝ වක්‍රව කිසිම ගනුදෙනුවක් ජනතා විමුක්ති පෙරමුණට නෑ.

**සෝමවංශ අමරසිංහ ජවිපෙ හිටපු නායකයාගේ නික්මයාම ජනතා විමුක්ති පෙරමුණට කොයි විදිහේ බලපෑමක් කරයිද?**
ඇත්තටම අපේ පක්ෂයේ ගමේ ඉන්න සාමාජිකයෙක් ඉවත්ව ගියත් පක්ෂයට බලපෑමක් ඇති කරනවා. ඉතිං සෝමවංශ අමරසිංහ සහෝදරයාගේ ඉවත්ව යාමෙන් පක්ෂයට බලපෑමක් ඇතිවීම වළක්වන්න බැහැ. එම බලපෑම අවම කරගනිමින් ඉසසරහට අපි කොහොමද වැඩ කටයුතු කරගෙන යන්නේ කියලා ප්‍රයත්නයක් දරන්න අපි උත්සාහ කරමින් සිටිනවා. ඒ වගේම යලි පක්ෂය සමඟ සම්බන්ධව වැඩකටයුතු කරගැනීම ගැන සෝමවංශ අමරසිංහ සහෝදරයාත් සමඟ සාකච්ඡාවක නිරතවීමට අපි උත්සාහ කරමින් සිටිනවා.

**ඔහුත් ඔබත් අතර ගැටුමක් නිසා ඔහු පක්ෂයෙන් ඉවත්ව ගිය බවට මාධ්‍ය වාර්තා පලවෙනවා?**
මා නම් ගැටුමක පාර්ශවකරුවෙක් නොවෙයි. කොහොම වුණත් දේශපාලන ව්‍යාපාරයක සිදුවීම් තිබෙනවා මාධ්‍ය හෝ රට දැනගත යුතු නැති. මේ ප්‍රශ්ණයත් එවැන්නක්.

සාකච්ඡා කළේ
ශ්‍රීලාල් සෙනෙවිරත්න

αlpha academy
Classes at Dandenong
Selective entry school exam preperation
Primary, Secondary, VCE
2015 Program
Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts Analytical Writing
Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457 908 918
ABN 52267352093

PRINTING
සමරු කළාප
ප්‍රවේශපත්
මුද්‍රණය සහ
සැළසුම් කිරීම
Wijitha Kumara
Tripple Gem Creations
0412 083 876
Souvenirs & Tickets




Tutoring
22 years of experience in tutoring in Melbourne with Proven Results.......!
Coaching for
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary
- Scholarship and Selective School exams
Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.
Small groups - up to 4 students.....!
Individual classes on request
Neranjana Kudaligama
0408 356 821
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School
Hemantha Devendra
0409 854 597
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)